# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2031/39 - 2017 අගෝස්තු මස 09 වැනි බදාදා - 2017.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු ආඥාපනත යටතේ නිවේදනයයි

**(ආදයම් සංරක්ෂණ ආඥාව - අංක 02/2017)**

රේගු ආඥාපනතේ (235 වැනි අධිකාරය) 10 වැනි වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව 2017 ජූලි මස 26 වැනි දින පවත්වන ලද ප්‍රසිද්ධ සභාවාරයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එච්. එස්. සමරතුංග,
ලේකම්,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 08 වැනි දින.
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

*යෝජනාව*

මෙම යෝජනාව ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලබන දිනයෙහි සිට (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ.

(අ) (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ විධිවිධාන යටතේ මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ ''අ'' උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන් වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බව ද,

1A - G 026082 - 37 (2017/08)
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ආ) (235 වන අධිකාරය වන) රේගු ආඥපනතේ ''අ'' උපලේඛනයෙහි විධිවිධාන යටතේ පවත්නා අනුග්‍රහ ලැයිස්තුව ඉවත්කර ඒ වෙනුවට මෙහි පළමුවන ඇමුණුමෙහි සඳහන් අනුග්‍රහ ලැයිස්තුව ආදේශ කර එම ඇමුණුමෙහි 2 වන තීරුවේ දක්වා ඇති භාණ්ඩයන් සම්බන්ධයෙන් එහි 3 වන තීරුවෙහි දක්වා ඇති ආනයන තීරු ගාස්තු ප්‍රමාණයන් අනුව තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බව, සහ

(ඇ) (235 වන අධිකාරය වන) රේගු ආඥපනතේ ''අ'' උපලේඛනයේ විධිවිධාන යටතේ පවත්නා නිදහස් කරන භාණ්ඩ ලැයිස්තුව ඉවත්කර, ඒ වෙනුවට මෙහි දෙවැනි ඇමුණුමෙහි සඳහන් නිදහස් කරන භාණ්ඩ ලැයිස්තුව ආදේශ කර එහි දැක්වෙන භාණ්ඩයන් ආනයන තීරු ගාස්තුවලින් නිදහස් කළ යුතු බවට ද,

මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

**උපලේඛනය**

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | තීරුබදු ප්‍රමාණය සාමාන්‍යය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| **12.01** | | | **සෝයාබෝංචි, කැබලි කළ හෝ නොකළ හෝ** | | | |
| | 1201.10 | - | බීජ | | 15% | කි.ග්‍රෑ. |
| | 1201.90 | - | අනෙකුත් | | 15% | කි.ග්‍රෑ. |
| 12.08 | | | අබ හැර තෙල් සහිත බීජ හෝ තෛලමය ඵලවල පිටි සහ ඇඹරුම් | | | |
| | 1208.10 | - | සෝයා බෝංචිවල | (PK) නිදහස් | 30% | කි.ග්‍රෑ. |
| | 1208.90 | - | අනෙකුත්-□ - | (PK) නිදහස් | 30% | කි.ග්‍රෑ. |
| **39.01** | | | **එතිලීන්වල බහු අවයවික, ප්‍රාථමික ස්වරූපවලින්** | | | |
| | 3901.10 | - | 0.94කට අඩු විශිෂ්ඨගුරුත්වයක් ඇත්තා වූ පොලිඑතිලීන් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස්<br>(AP) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 3901.20 | - | 0.94ක් හෝ එයට වැඩි විශිෂ්ඨගුරුත්වයක් ඇත්තා වු පොලිඑතිලීන් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස්<br>(AP) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 3901.30 | - | එතිලීන් - විනිල් ඇසිටේට් සහ බහුඅවයවික | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 3901.90 | - | අනෙකුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |

උපලේඛනය (සම්බන්ධිතයි)

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | සාමාන්‍යය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| **39.02** | | | **ප්‍රාථමික ස්වරූප දරණ, ප්‍රොපිලීන්වල හෝ අනෙකුත් ඔලිපින්වල බහු අවයවික** | | | |
| | 3902.10 | - | පොලි ප්‍රොපිලීන් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස්<br>(AP) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 3902.20 | - | පොලි අයිසොබියුටයිලීන් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 3902.30 | - | ප්‍රොපිලීන් සහ බහු අවයවික | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 3902.90 | - | අනෙකුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| **39.03** | | | **ප්‍රාථමික ස්වරූප දරණ ස්ටයිරීන්වල බහුඅවයවික** | | | |
| | | - | **පොලි ස්ටයිරීන් :** | | | |
| | 3903.11 | - - | ප්‍රසාරණශීලී | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 3903.19 | - - | අනෙකුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස්<br>(AP) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 3903.20 | - | ස්ටයිරීන් - ඇක්‍රයිලෝනයිට්‍රයිල් (එස්ඒඑන්) සහ බහුඅවයවික | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |

**උපලේඛනය (සම්බන්ධිතයි)**

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | සාමාන්‍යය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| | 3903.30 | - | ඇක්රයිලෝනයිට්‍රයිල්-බියුටාඩයින්-ස්ටයිරීන් (ඒබීඑස්) සහ බහු අවයවික වර්ග | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 3903.90 | - | අනෙකුත් | | | |
| | 3903.90.10 | - - - | ජලමූල සමජාතීය අවයවීයක (හෝමෝ පොලිමර්) සහ බහු අවයවීයක (කොපොලිමර්) | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 4 %<br>(SD) 1.5%<br>(AP) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 3903.90.90 | - - - | අනෙකුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස්<br>(AP) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| **39.04** | | | **ප්‍රාථමික ස්වරූප දරණ, විනිල් ක්ලෝරයිඩවල හෝ අනෙකුත් හැලජනීකෘත ඕලිපිනවල, බහු අවයවික** | | | |
| | 3904.10 | - | කිසියම් ද්‍රව්‍යයක් සමග මිශ්‍ර නොවූ, පොලි (විනිල් ක්ලෝරයිඩ්) | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | | - | අනෙකුත් පොලි (විනිල් ක්ලෝරයිඩ්) | | | |
| | 3904.21 | - - | ප්ලාස්ටික්කරණය නොකළා වූ | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 3904.22 | - - | ප්ලාස්ටික්කරණය කළා වූ | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 3904.30 | - | විනිල් ක්ලෝරයිඩ - විනිල් ඇසිටේට් සහ බහු අවයවික (කෝපොලිමර්) | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |

**උපලේඛනය (සම්බන්ධිතයි)**

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | සාමාන්‍යය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| | 3904.40 | - | අනෙකුත් විනිල් ක්ලෝරයිඩ සහ බහු අවයවික (කෝපොලිමර්) | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 3904.50 | - | විනිලිඩින් ක්ලෝරයිඩ බහු අවයවික | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | | - | ෆ්ලුඕරෝ-බහු අවයවික : | | | |
| | 3904.61 | - - | පොලි ටෙට්‍රාෆ්ලුඕරෝ එතිලීන් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 3904.69 | - - | අනෙකුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 3904.90 | - - | අනෙකුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| **40.11** | | | **රබර්වලින් නිමවූ, අළුත් වායු ටයර්** | | | |
| | 4011.10 | - | (ස්ටේෂන් වැගන් සහ ධාවන තරග සඳහා විශේෂ වූ මෝටර් රථ ඇතුළුව) මෝටර් කාර් සඳහා පාවිච්චි කරනු ලබන ඒවා | | 30% හෝ කි.ග්‍රෑමයකට රු.210/- | ඒකක |
| | 4011.20 | - | සාමාන්‍යයෙන් බස් සහ ලොරි සඳහා පාවිච්චි කරනු ලබන වර්ගයකට අයත් ඒවා | | | |
| | | - - | අඟල් 20ට නොඅඩු පට්ටම් සහිත | | | |
| | 4011.20.11 | - - - | සළකුණු නොමැති ටයර් ආවරණ | | 15% හෝ කි.ග්‍රෑමයකට රු.80/- | ඒකක |

උපලේඛනය (සම්බන්ධිතයි)

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | තීරුබදු ප්‍රමාණය සාමාන්‍යය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| | 4011.20.19 | - - - | අනෙකුත් | | 15% හෝ කි.ග්‍රෑමයකට රු.80/- | ඒකක |
| | 4011.20.90 | - - - | අනෙකුත් | | 30% හෝ කි.ග්‍රෑමයකට රු.140/- | ඒකක |
| | 4011.30 | - | සාමාන්‍යයෙන් ගුවන් යාත්‍රා සඳහා පාවිච්චි කරනු ලබන වර්ගයකට අයත් ඒවා | (SF) 5% (SD) 4.5% | 15% | ඒකක |
| | 4011.40 | - | සාමාන්‍යයෙන් මෝටර් සයිකල් සඳහා පාවිච්චි කරනු ලබන වර්ගයකට අයත් ඒවා | | 30% හෝ කි.ග්‍රෑමයකට රු.160/- | ඒකක |
| | 4011.50 | - | සාමාන්‍යයෙන් බයිසිකල් සඳහා පාවිච්චි කරනු ලබන වර්ගයකට අයත් ඒවා | | 30% | ඒකක |
| | | - | අනෙකුත්, 'හෙරිං බොන්' නම් වූ අඩියකින් හෝ ඒ හා සමාන වූ අඩියකින් යුක්ත වූ ෘ | | | |
| | 4011.61 | - - | කෘෂිකාර්මික හෝ වන වගා ආශ්‍රිත වාහන සහ යන්ත්‍ර උපකරණවලට භාවිතා කරන | | 30% | ඒකක |
| | 4011.62 | - - | රිම් ප්‍රමාණය (රෝද පට්ටම් තරම) සෙන්ටිමීටර් 61 නොඉක්මවන්නාවූ, ගොඩනැගිලි කර්මාන්ත හෝ කර්මාන්ත ආශ්‍රිත වාහන හෝ යන්ත්‍ර සඳහා භාවිතා කරන | | 30% | ඒකක |
| | 4011.63 | - - | රිම් ප්‍රමාණය (රෝද පට්ටම් තරම) සෙන්ටිමීටර් 61 ඉක්මවන්නාවූ, ගොඩනැගිලි කර්මාන්ත හෝ කර්මාන්ත ආශ්‍රිත වාහන හෝ යන්ත්‍ර සඳහා භාවිතා කරන | | 30% | ඒකක |
| | 4011.69 | - - | අනෙකුත් | | 30% | ඒකක |
| | | - - | අනෙකුත් | | | |
| | 4011.92 | - - | කෘෂිකාර්මික හෝ වන වගා ආශ්‍රිත වාහන සහ යන්ත්‍ර උපකරණවලට භාවිතා කරන | | 30% | ඒකක |
| | 4011.93 | - - | රිම් ප්‍රමාණය (රෝද පට්ටම් තරම) සෙන්ටිමීටර් 61 නොඉක්මවන්නාවූ, ගොඩනැගිලි කර්මාන්ත හෝ කර්මාන්ත ආශ්‍රිත වාහන හෝ යන්ත්‍ර සඳහා භාවිතා කරන | | 30% | ඒකක |

උපලේඛනය (සම්බන්ධිතයි)

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | සාමාන්‍යය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| | 4011.94 | - - | රිම් ප්‍රමාණය (රෝද පට්ටම් තරම) සෙන්ටිමීටර් 61 ඉක්මවන්නාවූ ගොඩනැගිලි කර්මාන්ත හෝ කර්මාන්ත ආශ්‍රිත වාහන හෝ යන්ත්‍ර සඳහා භාවිතා කරන | | 30% | ඒකක |
| | 4011.99 | - - | අනෙකුත් | | | |
| | 4011.99.10 | - - - | ත්‍රිරෝද රථ සඳහා භාවිතා කරන | | 30% හෝ කි.ග්‍රෑමයකට රු.150/- | ඒකක |
| | 4011.99.90 | - - | අනෙකුත් | | 30% හෝ කි.ග්‍රෑමයකට රු.210/- | ඒකක |
| 44.18 | | | **සවිවර ලී ජනේල, එකට වැද්දූ බිම් ආස්තරන පනේල, වහල සෙවිලි කිරීමට ගන්නා ලී පතුරු ලැලි සහ කොට පතුරු කෑලි සහ කොට පතුරු කෑලි ඇතුළු ගොඩනැගිලි කරුවන්ගේ වැද්දුම් සහ වඩු ආම්පන්න** | | | |
| | | - | එකට වැද්දූ බිම් ආස්තරණ පනේල : | | | |
| | 4418.71 | - - | කැටයම් කළ බිම් සඳහා : | | | |
| | 4418.71.10 | - - - | රබර් ලී වලින් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 5%<br>(SD) 5% | 30% | කි.ග්‍රෑ. |
| | 4418.71.20 | - - - | උණ බට වලින් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 5%<br>(SD) 5% | නිදහස් | කි.ග්‍රෑ. |
| | 4418.71.90 | - - - | අනෙකුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 5%<br>(SD) 5% | 30% | කි.ග්‍රෑ. |
| | 4418.72 | - - | අනෙකුත් තට්ටු කිහිපයක් සහිතඃ | | | |
| | 4418.72.10 | - - - | රබර් ලී වලින් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 5%<br>(SD) 5% | 30% | කි.ග්‍රෑ. |

උපලේඛනය (සම්බන්ධිතයි)

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | සාමාන්‍යය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| | 4418.72.20 | - | උණ බට වලින් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 5%<br>(SD) 5% | නිදහස් | කි.ග්‍රෑ. |
| | 4418.72.90 | - - - | අනෙකුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 5%<br>(SD) 5% | 30% | කි.ග්‍රෑ. |
| | 4418.79 | - - | අනෙකුත් | | | |
| | 4418.79.10 | - - - | රබර් ලී වලින් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 5%<br>(SD) 5% | 30% | කි.ග්‍රෑ. |
| | 4418.79.90 | - - - | අනෙකුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 5%<br>(SD) 5% | 30% | කි.ග්‍රෑ. |
| | 4418.90 | - | අනෙකුත් | | | |
| | 4418.90.10 | - - - | උණ බට වලින් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 5%<br>(SD) 5% | නිදහස් | කි.ග්‍රෑ. |
| | 4418.90.90 | | අනෙකුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 5%<br>(SD) 5% | 30% | කි.ග්‍රෑ. |
| **72.07** | | | **යකඩ හෝ මිශ්‍ර ලෝහ නොවන වානේවල අඩ වශයෙන් නිම කළ භාණ්ඩ** | | | |
| | | - | බරෙන් 0.25කට වඩා අඩු කාබන් ප්‍රමාණයක් අඩංගු : | | | |
| | 7207.11 | - - | පළල, ඝනකම මෙන් දෙගුණයකට අඩු සෘජුකෝණාශ්‍රාකාර (හතරැස් ඇතුළුව) අර්ධ කැපුමෙන් යුක්ත වූ | | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | සාමාන්‍යය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| | 7207.11.10 | - - - | කුට්ටි | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 7207.11.90 | - - - | අනෙකුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 7207.12 | - - | සෘජුකෝණාශ්‍රාකාර (චතුරශ්‍රාකාර හැර) හරස් කැපුමෙන් යුත් වූ අනෙකුත් | | | |
| | 7207.12.10 | - - - | කුට්ටි | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 7207.12.90 | - - - | අනෙකුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 7207.19 | - | අනෙකුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 7207.20 | - | බරෙන් 0.25% ක් හෝ ඊට වැඩියෙන් කාබන් අඩංගු වූ | | | |
| | 7207.20.10 | - - - | කුට්ටි | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 7207.20.90 | - - - | අනෙකුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |

උපලේඛනය (සම්බන්ධිතයි)

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය | | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| | | | | වරණීය (4) | සාමාන්‍යය (5) | |
| **72.24** | | | **පිරිසිදු කුට්ටි ආකාරයේ වූ හෝ අනෙකුත් ප්‍රාථමික ස්වරූපයෙන් යුත් අර්ධ නිමාවෙන් යුත් අනෙකුත් මිශ්‍ර ලෝහ වානේ** | | | |
| | 7224.10 | - | පිරිසිදු ලෝහ කුට්ටි ස්වරූපයෙන් සහ අනෙකුත් මූලික ස්වරූපවලින් යුක්ත වූ | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 7224.90 | - | අනෙකුත් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| **73.08** | | | **යකඩ හෝ වානේ වලින් නිමකළ නිර්මාණ (94.06 ශීර්ෂය යටතේ ගැනෙන කලින් ගලපා පූට්ටු කළ ගොඩනැගිලි හැර) සහ නිර්මාණ කොටස් (උදහරණ වශයෙන්, පාලම් සහ පාලම් කොටස්, සොරොව් දොරවල්, අටලු, ලැටිස්, කුඹගස්, පියසි, පියසි සැකිළි, දොර ජනේල සහ ඒවායේ රාමු, දොර උළුවහු, කවුළු, ගරාදි වැටවල්, කුළුණු සහ කණු), යකඩ හෝ වානේ වලින් නිමකළ නිර්මාණ ඉදිකිරීම් සඳහා පාවිච්චි කරන්නාවූ තැටි, පොලු, කෝණ කැලි, හැඩ කැලි, ඝන කොට කැලි, නළ සහ ඒ සමාන දෑ** | | | |
| | 7308.10 | - | පාලම් සහ පාලම් කොටස් | | 30% | කි.ග්‍රෑ. |
| | 7308.20 | - | අටලු සහ ලැටිස් කුඹගස් | (AP) 15% | 30% | කි.ග්‍රෑ. |
| | 7308.30 | - | දොරවල්, ජනෙල් සහ ඒවායේ රාමු, සහ දොරවල් සඳහා උළුවහු | (AP) 15% | 30% | කි.ග්‍රෑ. |
| | 7308.40 | - | පලංචි, කොන්ක්‍රීට් පෙට්ටි, හෝ වලවල්වලට මුක්කු ගැසීම සඳහා වූ මුක්කු සහ ඒ හා සමාන ආම්පන්න | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස්<br>(AP) නිදහස් | 30% | කි.ග්‍රෑ. |
| | 7308.90 | - | අනෙකුත් | (PK) නිදහස්<br>(AP) 15% | 30% | කි.ග්‍රෑ. |

උපලේඛනය (සම්බන්ධිතයි)

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | සාමාන්‍යය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| **83.09** | | | **නීච ලෝහයෙන් තනන ලද මූඩි, කැප් හා පියන් (කිරළ ඇබ, ස්කුරුප්පු කැප් හා වත් කරන මූඩි ඇතුළුව) බෝතල්, කැප්සියුල, පොට සහිත ඇබ, ඇබ කවර, මුද්‍රා හා වෙනත් ඇසුරුම් උපාංග** | | | |
| | 8309.10 | - | කිරළ ඇබ | | 15% | කි.ග්‍රෑ. |
| | 8309.90 | - | අනෙකුත් | | | |
| | 8309.90.10 | - - - | රෝල් ඕවර් සහ කැප්සියුල | | 30% | කි.ග්‍රෑ. |
| | 8309.90.20 | - - - | බෑග් මුද්‍රා තැබීමට යොදා ගන්නා යකඩ හෝ වානේ බැමි | | 30% | කි.ග්‍රෑ. |
| | 8309.90.30 | - - - | ලෝහමය බඳුන් සඳහා සම්පූර්ණ වශයෙන් ඇදීමෙන් පහසුවෙන් විවර කළ හැකි අග්‍ර සහිත කෙළවර වැසුම් | | නිදහස් | කි.ග්‍රෑ. |
| | 8309.90.40 | - - - | ලෝහමය බඳුන් සඳහා සිදුරක් ලෙස පහසුවෙන් විවර කළ හැකි අග්‍ර සහිත කෙළවර වැසුම් | | 15% | කි.ග්‍රෑ. |
| | 8309.90.90 | - - - | අනෙකුත් | | 15% | කි.ග්‍රෑ. |
| 84.82 | | | බෝල හෝ රෝලර බෙයාරින් | | | |
| | 8482.10 | - | බෝල බෙයාරින් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස්<br>(GT) නිදහස්<br>(AP) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| **85.07** | | | **විද්‍යුත් සංචායක (ඉලෙක්ට්‍රික් ඇකියුම්යුලේටර්), ඒ සඳහා හෙජක ඇතුළත්ව, සෘජුකෝණාශ්‍රාකාර වූවත් නොවූවත් (චතුරශ්‍ර ඇතුළත්)** | | | |
| | 8507.10 | - | පිස්ටන් එන්ජින් ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරන වර්ගයේ, ඊයම් - අම්ල | | | |
| | 8507.10.10 | - - - | පිස්ටන් එන්ජින් ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරන වර්ගයේ මුද්‍රිත, වහා භාවිතයට ගත හැකි ඊයම් අම්ල සංචායක | | 30% හෝ කි.ග්‍රෑමයකට රු.150/- | ඒකක |
| | 8507.10.90 | - - - | අනෙකුත් | | 30% හෝ කි.ග්‍රෑමයකට රු.150/- | ඒකක |

උපලේඛනය (සම්බන්ධිතයි)

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය | | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| | | | | වරණීය (4) | සාමාන්‍යය (5) | |
| 85.11 | | | පුළිඟු -ජ්වලන හෝ සම්පීඩන -ජ්වලන අන්තර් දහන ඇන්ජින් සඳහා විදුලිමය ජ්වලන හා පන ගන්වන උපකරණ (උදාහරණ වශයෙන්, ජ්වලන මැග්නෙටෝ, මැග්නෙටෝ ඩයිනමෝ, ජ්වලන දඟර, ස්පාර්ක් ප්ලග් සහ ග්ලෝ ප්ලග්, ස්ටාටර් මෝටර්) එවැනි එන්ජින් සමග පාවිච්චි කෙරෙන ජනක (උදාහරණ වශයෙන්, ඩයිනමෝ සහ ප්‍රත්‍යාවර්තක) සහ කටවුට් | | | |
| | 8511.10 | - | ස්පාක් ප්ලග් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) 5%<br>(SD) 4.5% | නිදහස් | ඒකක |
| 87.05 | | | ප්‍රධාන වශයෙන් පුද්ගලයන් හෝ බඩු ප්‍රවාහනය සඳහා සැලසුම් කරන ලද ඒවා හැර, විශේෂ කාර්යය මෝටර් වාහන (උදාහරණ වශයෙන්, ආපදා ලොරි, දෙඹකර ලොරි, ගිනි නිවීමේ වාහන, කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ ලොරි, මාර්ග අතුගෑමේ ලොරි, ඉසීමේ ලොරි, ජංගම වැඩපළ ජංගම රශ්මි විද්‍යා ඒකක) | | | |
| | 8705.90 | - | අනෙකුත් | | | |
| | | - - - | කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ පොම්ප සහිත ලොරි | | | |
| | 8705.90.31 | - - - | අවුරුදු දහයකට වඩා නොපැරණි | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | ඒකක |
| | 8705.90.32 | - - - | අවුරුදු දහයකට වඩා පැරණි | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | නිදහස් | ඒකක |

*ඇමුණුම I*

*අනුග්‍රහ ලැයිස්තුව (ආනයන)*

| *අයිතම* (1) | *විස්තරය* (2) | *තීරුගාස්තු ප්‍රමාණය* (3) |
|---|---|---|
| 01 | මැණික් හා ස්වර්ණාභරණ ඇසිරීම සඳහා වන ආනයනය කරන ලද ඇසුරුම් පෙට්ටි, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ ලේකම් ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව, | 7.5% |
| 02 | සුවඳ විලවුන් ඇසිරීම සඳහා වන ආනයනය කරන ලද ඇසුරුම් බඳුන් හා එහි කොටස් කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව, | 7.5% |
| 03 | විදුලි මෝටර් තුළ ස්වයංක්‍රීයව එතීම සඳහා වන ආයනය කරන ලද එනමල් තඹ කම්බි, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව, | 7.5% |
| 04 | මුහුණ බලන කණ්නාඩි නිෂ්පාදන කර්මාන්තය සඳහා යොදා ගන්නා කණ්නාඩි පසුපස සඳහා වන ආනයනය කරන ලද තරමෝසෙට්න් තීන්ත. කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව, | 15.0% |

*ඇමුණුම II*

*රේගු බද්දෙන් නිදහස් භාණ්ඩ ලැයිස්තුව (ආනයන)*

පහත සුවිශේෂව දක්වා ඇති අරමුණක් හෝ අරමුණු සඳහා ආනයනය කරනු ලබන සහ එකී අරමුණක් හෝ අරමුණු සඳහාම ආනයනය කර ඇති බවට රේගු අධ්‍යක්ෂ ජනරාල් සෑහීමකට පත්වන්නේ නම් හා ඒ සඳහා භාණ්ඩාගාරයේ ලේකම් ගේ හෝ භාණ්ඩාගාරයේ ලේකම් විසින් බලය පවරන ලද වෙනත් අධිකාරයක හෝ අනුමැතිය ලැබී ඇත්නම්, එම භාණ්ඩ ආනයන තීරු බද්දෙන් නිදහස් කෙරේ.

01. රේගු ආඥා පනතේ (235 වැනි අධිකාරය) 107 'අ' වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලද රෙගුලාසි අනුව මගීන්ගේ ගමන් බඩු ලෙස අර්ථ දක්වා ඇති භාණ්ඩ,

02. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හෝ ඒ යටතේ වන විශේෂිත නියෝජිත ආයතනයක් විසින් නිෂ්පාදනය කෙරුණු ආනයනය කරන ලද, අධ්‍යාපනික, විද්‍යාත්මක හෝ සංස්කෘතිකමය චිත්‍රපට අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

03. වෘත්තීමය හා විද්‍යාත්මක උපකරණ සහ ශික්ෂණ ශාස්ත්‍රයෙහි ලා අවශ්‍ය වන තාවකාලිකව ආනයනය කරන ලද ද්‍රව්‍ය, රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන ඇපකරයකට යටත්ව,

04. කලා, සාහිත්‍ය, විද්‍යා හෝ ක්‍රීඩා යන විෂයයන්හි දක්වූ විශිෂ්ඨත්වය හෝ පොදුජන සේවය හෝ නැතහොත්, ප්‍රශංසනීය කාර්ය සාධනය හා පැවැත්ම සනිටුහන් කිරීම සඳහා යම් පුද්ගලයෙකුට විදේශයකදී ප්‍රදානය කරන ලදුව, එකී පුද්ගලයා විසින් හෝ ඔහු වෙනුවෙන් ආනායනය කරනු ලැබන භාණ්ඩ, අදළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත අදළ වන ලියකියවිලි රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට යටත්ව,

05. ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය ආනයනය කරන ලද අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

06. ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය ක්‍රම සඳහා උපයෝගී කරගනු ලබන බවට දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුදැනුම ඇතිව රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයක් මගින් නිශ්චය කොට ඇති ආනයනය කරන ලද සැකසූ සහ සකස් නොකළ ඖෂධ වර්ග (විලවුන් පිළියෙල කිරීම සඳහා නොවන) හා ඖෂධ පැලෑටි, අමුද්‍රව්‍ය දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

07. ආයුර්වේද/ඖෂධීය සබන් සහ ආයුර්වේද/ඖෂධීය දන්තාලේප හැර ආයුර්වේද, සිද්ධ, යුනානි වෛද්‍ය ක්‍රම සඳහා උපයෝගී කරගන්නා සැකසූ සහ සකස් නොකළ ඖෂධ සහ ඖෂධ සැදීම සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය ඇසිරීම සඳහා ආනයනය කරන ලද ඇසුරුම් ද්‍රව්‍ය දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

08. කුකුළු කර්මාන්තය සඳහා භාවිතා කරනු ලබන කොටස් හා උපාංග ඇතුළත්ව ආනයනය කරන ලද පෙරසවි කුකුළු පාලන නිවාස, පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

09. සෞඛ්‍ය සේවාවන් පවත්වාගෙන යාම සඳහා ආනයනය කරන ලද වෛද්‍ය, ශල්‍ය වෛද්‍ය හා දන්ත වෛද්‍ය උපකරණ ඇතුලු යන්ත්‍රෝපකරණ, ආම්පන්න උපකරණ කට්ටල, උපාංග, ඒවායේ කොටස් සහ ගිලන් රථ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලෙක්කම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

10. විදේශයන්හි නිෂ්පාදිත හා ආනයන තීරුබදු පෙර වතාවක දී ගෙවා ඇති ප්‍රති ආනයනය කරන ලද භාණ්ඩ, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

11. ස්වාභාවික හෝ අනෙකුත් ආපදවන්ට සහන වශයෙන් පිටරට පුද්ගලයින්ගෙන් හෝ සංවිධානයන්ගෙන් පරිත්‍යාග වශයෙන් ලැබ ආනයනය කරන ලද භාණ්ඩ, අදල රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරලාගේ අනුමැතියට යටත්ව,

12. ප්‍රදර්ශන, සල්පිල්, රැස්වීම්, හෝ ඒ හා සමාන අවස්ථාවන්හිදී ප්‍රදර්ශනය කිරීම හෝ පාවිච්චි කිරීම සඳහා ආනයනය කරන ලද භාණ්ඩ, රේගු අධක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන ඇපකරයකට යටත්ව,

13. භාණ්ඩාගාරයේ ලේකම් විසින් අනුමත කරන ලද නියමයන් හා කොන්දේසිවලට යටත්ව සිය නිෂ්පාදනවලින් 50% ක් හෝ වැඩි කොටසක් අපනයනය කරනු ලබන හෝ ඍජු අපනයනකරුවන්ට සපයන කර්මාන්තයක භාවිතය සඳහා පමණක් ආනයනය කරන ලද පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ තැනීම සඳහා භාවිතා කරන ද්‍රව්‍යයන් හා කොටස්, ප්‍රාග්ධන හා අතරමැදි භාණ්ඩ සහ ප්‍රවාහන උපකරණ,

14. මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද නියමයන් හා කොන්දේසිවලට යටත්ව, අපනයනය කිරීම සඳහා ගෙන්වා නිමහම් කිරීමේ වැඩ පිළිවෙළ යටතේ, ආනයනය කරන ලද යෙදවුම් ද්‍රව්‍යයන් (අමුද්‍රව්‍ය, සංරචක හා කොටස්),

15. රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද කොන්දේසි හා නියමයන්ට අනුකූලව ප්‍රති අපනයනය කිරීම සඳහා ආනයනය කරන ලද, අලංකාරය සඳහා ඇති කරන මත්ස්‍යයින්,

16. ශ්‍රී ලංකාවේ වරායක ලියාපදිංචි කරන ලද හෝ ධීවර අමාත්‍යාංශයෙන් නිකුත් කළ ගොඩ බැසීමේ අවසර පත්‍රයක් මත ශ්‍රී ලංකා වරායක සිට මුහුදු යන්නා වූ ධීවර යාත්‍රාවකින් අල්ලා ගන්නා ලද මාළු,

17. ජාත්‍යාන්තර ගුවන් සේවාවක් පිහිටුවීම සහ නඩත්තු කිරීමට අදාළව ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපලක සීමාවන් ඇතුළත පාවිච්චි කිරීම සඳහා ආනයනය කළ උපකරණ, ද්‍රව්‍ය හා ගුවන් යානා අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීමට අදාළ කොටස් හා උපාංග, අදාළ රේඛීය අමාත්‍යංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යත්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

18. අධ්‍යාපනික හෝ පර්යේෂන කටයුතු සඳහා අවශ්‍ය වන ආනයනය කරන ලද උපකරණ, ඖෂධ වර්ග සහ රසායන ද්‍රව්‍යයයන්, අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ/අදාළ විශ්ව විද්‍යාලවල බලයලත් නිලධාරීන්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

19. බහලු මුද්‍රා ඇතුළුව ආරක්ෂිත ලෙස භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කෙරෙන ආනයනය කරන ලද බහාලු සහ ඒවායේ උපාංග, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

20. විලවුන් උපකරණ සහ ඖෂධ පනත යටතේ ඖෂධ වශයෙන් ලියාපදිංචි කර ඇති බවට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිර්දේශ කරනු ලැබූ ආනයනය කරන ලද නිෂ්පාදන හා පිළියෙල කිරීම් රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

21. ශ්‍රී ලංකා රුපියල් පහළොස් දහස (රු. 15,000/-) නොඉක්මවන්නා වූ වටිනාකමින් යුත් පෞද්ගලික පරිහරණය සඳහා ආනයනය කරන ලද භාණ්ඩ (ත්‍යාග ඇතුලත්ව) රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

22. රේගු අධ්‍යක්ෂක ජනරාල් විසින් පනවනු ලබන කොන්දේසි වලට යටත්ව ශ්‍රී ලංකා රුපියල් පනස් දහක (රු. 50,000/-) නොඉක්ම වූ වටිනාකමින් යුත් වාණිජමය කටයුතු සඳහා ආනයනය කරනු ලබන නියදියන් (සාම්පල),

23. දියර කිරි, එළවළු සහ පළතුරු යුෂ ඇසිරීම සඳහා භාවිතා කරන ආනයනය කරන ලද, පොළිඑතලින් පටල සහ ඇලුමිනියම් ලෝපත් හෝ පොලිඑතලින් හා එතිලින් විනිල් පටල වලින් යුක්ත බහුපටල ඇසුරුම් ද්‍රව්‍ය, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්‍ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

24. පාකිස්ථාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තීරණය වී ඇති පංගු (Quota) සීමාව දක්වා, ආනයනය කරන ලද දිගු ඇට සහිත පාකිස්ථාන් සහල් (බාස්මති) සහ අර්තාපල්, වෙළඳ හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්‍ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

25. විදුලිබල බෙද හැරීම ද ඇතුළුව විදුලිබලය සැපයීමේ කාර්ය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය හා එහි පාලිත සමාගම් විසින් ආනයනය කරනු ලබන යන්ත්‍ර උපකරණ ද්‍රව්‍ය සහ උපයෝගිතා වාහන සහ රජය හා එහි සංවර්ධන කොටස් කරුවන් අතර ඇතිකර ගත් ගිවිසුම් යටතේ සූර්ය බලශක්තිය හා සුළං බලය නිපදවීමෙ ව්‍යාපෘතීද ඇතුලත්ව විදුලිය ජනනය කිරීම සඳහා අවශ්‍ය වන එවැනි අයිතමයන් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්‍ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

26. සිනමාකරණ කටයුතු සඳහා භාවිතා කරනු ලබන ආනයනය කරන ලද භාණ්ඩ සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලදුව, තව දුරටත් සකස් කිරීම සඳහා හෝ මුද්‍රණය/පිටපත් කිරීම සඳහා විදේශ රටකට යවන ලද සිනමා පට, ජාතික චිත්‍රපටි සංස්ථාවේ නිර්දේශය මත, රේගු අධ්‍යක්‍ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

27. පාවහන් සහ ගමන් මලු නිෂ්පාදන කර්මාන්තය සඳහා යොද ගැනීමට ආනයනය කරන ලද නිම කළ, හෝ අදළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්‍ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

28. ශ්‍රී ලංකාවේම සකස් කරන ලද නිර්මාණ සටහන් මත ඉලෙක්ට්‍රොනික හා රොබෝ උපකරණ ආශ්‍රිත උපකරණ නිෂ්පාදනය කිරීම සඳහා ඒ අශ්‍රිත කර්මාන්තශාලා විසින් ආනයනය කරනු ලබන මෙවලම්, උපකරණ හා ද්‍රව්‍ය ජාතික විශ්ව විද්‍යාලයක (විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ස්ථාපිත) උසස් අධ්‍යාපන/කාර්මික අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශ ලේකම් මගින් රේගු අධ්‍යක්‍ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

29. රාජ්‍ය ආරක්‍ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ පරිදි, ජාතික ආරක්ෂාව සඳහා සන්නද්ධ සේනාධිපතීන් හා පොලිස්පති විසින් ආනයනය කරන ලද සන්නද්ධ සේවාවලට යොද ගත හැකි ආම්පන්න, අවි අයුධ, යුද්ධෝපකරණ, වෙඩි බෙහෙත්, පුපුරණ ද්‍රව්‍ය, සන්නිවේදන උපකරණ, සන්නද්ධ රථ, ගුවන්යානා, නාවික යාත්‍රා සහ ඒවායේ අමතර කොටස් භාණ්ඩාගාරයේ ලේකම්ගේ අනුමැතියට යටත්ව,

30. ධීවර බෝට්ටු නිෂ්පාදකයන් විසින් ධීවර බෝට්ටු නිෂ්පාදනය පිණිස ආනයනය කරන ලද අමුද්‍රව්‍ය, සංරචක, උපාංග හා කොටස් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්‍ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

31. කෘෂි කර්මාන්තයේ හා ඒ ආශ්‍රිත කටයුතු සඳහා යොද ගැනීමට ආනයනය කරන ලද කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, පහත සඳහන් ආම්පන්න, කාලගුණ ඒකක, හරිතාගාර, පොලිතීන් ගෘහ, දිය/තුහීන ඉසින යන්ත්‍ර, බිංදු වැස්සුම් වාරි පද්ධති, පොහොර කිරීමේ පද්ධති, පස් රහිතව පැල වැවීමේ ක්‍රියාවලියට (හයිඩ්‍රොපෝනික්) යොද ගන්නා පද්ධති, උෂ්ණත්ව පාලන හා වාතාශ්‍රය ලබාදෙන පද්ධති හා ඒවායේ කොටස් හා අමුද්‍රව්‍ය හා වසුන් ආස්තර, පොකුණු ආස්තරන, ආවරණ දැ රේගු අධ්‍යක්‍ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

32. ආහාර වර්ග ඇසුරුම් සඳහා විශේෂයෙන් පාවිච්චි කෙරෙන ලෝහ කෙන්ඩි (cans) සහ පියන් (closuries) වල අලේප කිරීම සඳහා යොදගන්නා ආනයනය කරන ලද ලැකර් වර්ග, ආලේපන වර්ග සහ වාර්නිෂ් වර්ග කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්‍ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

33. 87 පරිච්ඡේදය යටතේ දක්වෙන නිශ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද අදළ වන්නාවූ ආනයනය කරන ලද මෝටර් වාහන එන්ජින් සවිකළ චැසි, බද (බෝඩි) කැබ්ස් ඇතුළුව

34. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ආනයනය කරනු ලබන වාහන අමතර කොටස් හා උපාංග හා දුම්රිය එන්ජින්, ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

35. පිළිගත් ටයර් නිෂ්පාදකයකු විසින් දේශීයව අගය එකතු කිරීමේ ක්‍රියාවලිය සඳහා ආනයනය කරන ලද සලකුණු නොමැති ටයර් ආවරණ, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

36. ඉරිඟු, පරිප්පු සහ සහල් හැර සත්ත්ව හා කුකුල් කෑම නිෂ්පාදනය සඳහා ආනයනය කරන ලද අනෙකුත් සංඝටක පශු සම්පත් සංවර්ධන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

37. දේශීය වශයෙන් දුනු කොළ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ආනයනය කරන ලද තාපයෙන් මැඩීම, තාපයෙන් ඇදීම හෝ තෙරපීම හැර තවදුරටත් නොසැකසූ වානේ දඬු සහ පොලුවර්ග කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

38. කාර්මික රාක්ක පද්ධති නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ආනයනය කරන ලද I හැඩයේ ඝන කොට කැලි (රේගු සංකේත අංක 7216.32), H හැඩයේ ඝ න කොට කැලි (රේගු සංකේත අංක 7216.33) සහ වෙනත් අයුරකින් සින්ක් ප්ලේට කළාවූ හෝ ආලේප කළාවූ (රේගු සංකේත අංක 7212.30) වර්ග කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

08-1070

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.